Department of Education, Sabaragamuwa Province/ Weekly School



## 1.7 අභිනය හඳුනාගනිමු

වේදිකා නාට්‍යයක් රංගන කිරීමේදී චරිත නිරූපණයේ යෙදෙන නළුවන් සිය භාවයන් ප්‍රේක්ෂකයා වෙත ප්‍රක්ශේපනය කිරීම සඳහා අභිනය භාවිතා කරයි. එය ඉදිරිපත් කරන ශෛලිය අනුව වෙනස්වේ. භරතමුණි විසින් නාට්‍ය ශාස්ත්‍රයේ ඉදිරිපත් කර ඇති පරිදි නාට්‍ය ශෛලින් දෙකකි. එනම්

1. ලෝකධර්මී ශෛලිය - පවතින ස්වභාවය ඒ ආකාරයෙන්ම වේදිකාව මත ඉදිරිපත් කිරීම
   උදා- මනමේ, සිංහබාහු
2. නාට්‍ය ධර්මී ශෛලිය - පවතින ස්වභාවය ඉක්මවා යමින් අතිශයෝක්තියකින් ඉදිරිපත් කිරීම
   උදා- තල මල පිපිලා, කැළණි පාලම

නාට්‍යක් ප්‍රේක්ෂකයන් වෙත ඉදිරිපත් කරන මාධ්‍ය අභිනයයි. මෙම නාට්‍ය ශෛලීන් දෙකෙහිදීම සතර අභිනය භාවිතා කරයි. අභිනය නොමැතිව නාට්‍යක් ඉදිරිපත් කළ හැකි නොවෙති. නාට්‍ය ශාස්ත්‍රයට අනුව අභිනය ප්‍රධාන වශයෙන් කොටස් හතරකි. එනම්

1. සාත්වික අභිනය - මුහුණින් අදහස් ප්‍රකාශ කිරීම.
   උදා- දුක ,සතුට,තරහ,භය,පිළිකුල
2. වාචික අභිනය - ගීත/වචන මගින් අදහස් ප්‍රකාශ කිරීම.
   උදා- මීයා- කිසිම දෙයක් ලැබුනේ නෑ
   කුස්සි ගානේ අවිද්ද මං
   දැන් ඉස්සර වගේගෙවල
   වැඩි පුර කෑමක් නැහැනේ
3. ආංගික අභිනය - අංග,ප්‍රත්‍යංග,උපාංග භාවිතයෙන් අදහස් ප්‍රකාශ කිරීම.
   උදා- (එන්න එපා යන්න) පැවසීම අතින් කිවහැකිය
4. ආහාර්ය අභිනය - නළු සිරුරට අමතරව වේදිකාවට පිටතින් ගෙන එනු ලබන සියළුම දේ.
   උදා- රංගවස්ත්‍රාභරණ, අංගරචනය, රංගභාණ්ඩ, පසුතල, රංගාලෝකය(අනුසාංගික අංග)










සතර අභිනය හදුන්වා ඊට අදාල පින්තූර අලවා කුඩා පොතක් සකස් කරන්න